www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සාම වෙස් මුහුනට මුවා වී ශ්‍රී ලංකා ආන්ඩුව සිවිල් යුද්ධය කරා යන තල්ලුව වේගවත් කරයි

**Under the guise of peace, Sri Lankan government accelerates drive to civil war**

**විජේ ඩයස් විසිනි**
**2006 ජුනි 22**

පූර්න පරිමාන සිවිල් යුද්ධයක් දෙසට යන පල්ලම් බැසීම මධ්‍යයේ, ශ්‍රී ලංකා ආන්ඩුව, ජුනි 18 දා, සිය සාම ලේකම් කාර්යාලය හරහා, අතිශයින් ම නරුම නිවේදනයක් නිකුත් කලේ ය. ජාත්‍යන්තර මාධ්‍ය මගින් එම නිවේදනය "සාම සාකච්ඡා සඳහා කල කැඳවුමක්" ලෙස වර්නනාවට ලක් කර තිබුනි. එහෙත් එය විස්තර කිරීමට වඩා සුදුසු ආකාරය වන්නේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීමක් ලෙස ය.

සාම සාකච්ඡා බිඳ වැටීමට හේතුව ලෙස එල්ටීටීඊයේ "දඩබ්බර" ක්‍රියාකලාපය හෙලා දුටු එම නිවේදනය, "සිය දේශපාලන එල්ලයන් ජය ගනු පිනිස ප්‍රචන්ඩත්වය හා ත්‍රස්තවාදය" මත පදනම් වීමේ එල්ටීටීඊයේ පිලිවෙත ද හෙලා දකිමින්, කිසිදු සාක්ෂ්‍යයක් ඉදිරිපත් නොකරම, ජුනි 15 දා කැබිතිගොල්ලෑව නගරය අසල දී බෝම්බ පිපිරීමකින් සිංහල ගම්වැසියන් 64ක් ඝාතනය කිරීම ගැන එල්ටීටීඊයට චෝදනා කරයි.

කැබිතිගොල්ලෑවේ ජන ඝාතනය එල්ටීටීඊයට එරෙහිව රුදුරු ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා ආරම්භක නිමිත්තක් වී තිබේ. ආන්ඩුවේ සාම ලේකම් කාර්යාලය එල්ටීටීඊයට පහර ගහන්නේ "කිසිදු තේරුමක් නැතිව අහිංසක සිවිල් වැසියන් ඝාතනය කරන සදාකාලික ඝාතන යන්ත්‍රයක්" ලෙස ය. "එල්ටීටීඊය සාම ක්‍රියාදාමයෙන් ඉවත් වීමට තීන්දු කර ඇති බවක් පෙනී යයි. සාම ක්‍රියාදාමයෙන් ඉවත් වීම තෝරා ගනු පිනිස යුක්තිකරනයක් ලෙස ජන වාර්ගික ප්‍රතිප්‍රහාරයක් ඉලක්ක කර ගැනීම ඔවුන්ගේ මූලෝපාය බව ද පෙනී යයි. ශ්‍රී ලංකාවේ ආන්ඩුව එවැන්නක් සිදු වීමට ඉඩ නොදෙන බව එල්ටීටීඊය දැන ගත යුතු ය."

ආන්ඩුවේ සාම ලේකම් කාර්යාලය සිය නිවේදනය සමාප්ත කරමින්, "සාම සාකච්ඡාවලට" යලි එක්වන ලෙසත් "සියලු පාර්ශ්වයන් ඇතුලත් සාම ක්‍රියාදාමයකට කැප වී ගන්නා" ලෙසත් එල්ටීටීඊයට කරන ආයාචනය බාහිර සැරසිල්ලකට වැඩි යමක් නොවේ. එල්ටීටීඊය සදාකාලික, අහේතුක ඝාතන යන්ත්‍රයක් ලෙස සලකන්නේ නම්, එම සංවිධානය සමග සාකච්ඡා මේසයට ඉඳ ගන්නේ ඇයි? තාර්කික නිගමනය වනවා ඇත්තේ, එල්ටීටීඊය මිලිටරිමය ලෙස තලා දැමිය යුතු ය යන්න ය. කොලඹ ආන්ඩුව නිසැකව ම සූදානම් වන්නේ ද එහි සිංහල ස්වෝත්තමවාදී සගයන් -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය -- විවෘතව ඉල්ලා සිටින්නේ ද එය යි.

සාකච්ඡා යෝජනා කෙරී ඇති ආකාරය පවා -- "සියලු පාර්ශ්වයන් ඇතුලත් සාම ක්‍රියාදාමයක්" -- ඉලක්ක කර ඇත්තේ පැවති එක්සත් ජාතික පක්ෂ (එජාප) නායකත්වයෙන් යුත් ආන්ඩුව 2002 දී ආරම්භ කල සාකච්ඡාවන්ට වල කැපීමට යි. එල්ටීටීඊය නිරතුරුව ම අවධාරනය කලේ -- ස්වයං-ප්‍රකාශිත "දෙමල ජනතාවගේ එකම නියෝජිතයා" ලෙස -- සෙසු පක්ෂ සහ කන්ඩායම් ඉවත් කල යුතු බව යි. සාකච්ඡා මේසයට වෙනම මුස්ලිම් නියෝජනයක් ඇතුලත් කිරීමේ එජාප ප්‍රයත්නයන්ට එය විරුද්ධ විය.

දිවයින යලි යුද්ධය තුලට තල්ලු කරමින් ම, සාමයේ හා සංයමයේ අද්වකාත්වරයකු ලෙස පෙනී සිටීමේ වත්මන් එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවේ ප්‍රයත්නය අරමුනු ගනනාවක් වෙනුවෙන් සේවය කරයි. ප්‍රථම කොට ම, එහි එල්ලය වන්නේ මහ බලවතුන්ගේ සහය තම පාර්ශ්වය වෙත දිනා ගැනීම යි. දෙවනුව, එහි අරමුන වන්නේ, ශ්‍රී ලංකාවේ මහජනතාව මුලා කිරීම යි. ජනතාවගෙන් අති මහත් බහුතරයක් දැනටමත් ජීවිත 65,000ක් බිලි ගෙන ඇති 20 අවුරුදු යුද්ධය කරා යලි ඇද වැටීමකට විරුද්ධ ය.

එමෙන් ම, "ත්‍රස්තවාදී" එල්ටීටීඊය ආක්‍රමනිකයා ලෙස හෙලා දැකීම මගින්, "සාම ලේකම් කාර්යාලය" වාර්ගික ආතතීන් ඇවිලවීමටත් එල්ටීටීඊයේ එල්ලය ලෙස එය චෝදනා කරන තත්වය ම -- "ජන වාර්ගික ප්‍රතිප්‍රහාරයක්" -- සඳහා දේශපාලන වාතාවරනය නිර්මානය කිරීමටත් හිතාමතා ම කටයුතු කරයි. එය වනාහි, පසු ගිය අඩ සියවස තිස්සේ ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතයේ ආවේනික සලකුනක් වූ දුෂ්ට දෙමල විරෝධී ජන සංහාරයක් මුදා හැරීම සඳහා යෙදෙන ශිෂ්ට පදයකි.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය, එල්ටීටීඊයට කිසිදු දේශපාලන සහයෝගයක් දෙන්නේ නැත. දෙමල ඊලම් නමින් වෙනම ධනපති රාජ්‍ය නට්ටක් ඇටවීමේ එහි බංකොලොත් ඉදිරිදර්ශනය දිවයිනේ දෙමල සුලුතරය තල්ලු කර ඇත්තේ මාරාන්තික උගුලක් තුලට ය. අහිංසක සිංහල සිවිල් වැසියන්ට එරෙහි ප්‍රචන්ඩ ප්‍රහාර ඇතුලු එහි ප්‍රතිගාමී වර්ගෝත්තමවාදය, වැඩ කරන ජනතාව අතර භේදයක් ඇති කිරීමේ හා සමාජවාදී වැඩපිලිවෙලක පදනම මත ඒකාබද්ධ දේශපාලන ප්‍රහාරයක් සඳහා වූ අරගලය වලකාලීමේ ආනුශංගික කොලඹ ආන්ඩුවල වැඩපිලිවෙලට සෘජුව සහයෝගය දී ඇත.

එහෙත් රට යලි යුද්ධය තුලට තල්ලු කිරීම සම්බන්ධයෙන් දේශපාලන වගකීම පැවරෙන්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව වෙත ය. රාජපක්ෂ, ජවිපෙ හා හෙල උරුමයේ පිටුබලය සහිතව පසු ගිය නොවැම්බරයේ දී බලයට පත් වීමෙන් පසුව, එල්ටීටීඊයට හා එහි ආධාරකරුවන්ට එරෙහිව ප්‍රකෝපකාරී ප්‍රහාර උත්සන්න කරනු පිනිස කොල එලිය දල්වා ඇත. මෙම අවෘත යුද්ධයේ දී විවිධාකාර එල්ටීටීඊ විරෝධී සන්නද්ධ කන්ඩායම් සමග හවුල් වීම පිලිබඳ චෝදනා මිලිටරිය ප්‍රතික්ෂේප කරන නමුදු, ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ (එස්එල්එම්එම්) මෑත ම ප්‍රකාශය පවා මිලිටරියේ කියාපෑම්වලට ප්‍රතිකූල සාක්ෂ්‍යය ගොන්නක් ගෙන හැර දක්වයි.

රාජපක්ෂගේ සගයන් වන ජවිපෙ හා හෙල උරුමය, එල්ටීටීඊයට වල කපනු පිනිස 2002 සටන් විරාමය අති මූලික ලෙස සංශෝධනය කල යුතු යැයි ප්‍රකෝපකාරී ලෙස ඉල්ලා සිටිමින්, සාම ක්‍රියාදාමය යලි යලිත් හෙලා දක තිබේ. ආන්ඩුවේ සාකච්ඡාකරුවන් සටන් විරාම ගිවිසුම වෙනස් කල යුතු යැයි ඉල්ලා සිටි තතු යටතේ, පෙබරවාරියේ දී ජිනීවාහි පැවති සාකච්ඡා බිඳ වැටීමේ ආසන්නයට පැමිනියේ ය. ඇත්ත වසයෙන් ම, "සාම ලේකම් කාර්යාලයට" වාර්ගික වෛරය ඇවිලවීමෙහි ලා ජවිපෙ හා හෙල උරුමය ඉටු කරන ක්‍රියාකලාපය ගැන කීමට කිසිවක් නැත. එමෙන් ම, එය, නොවැම්බරයේ සිට මේ දක්වා ජීවිත සිය ගනනක් බිලි ගෙන ඇති උතුරේ හා නැගෙනහිර අප්‍රකට යුද්ධය තුල මිලිටරිය හා ඔවුන් සමග සහයෝගී පැරා-මිලිටරි කන්ඩායම් ඉටු කරන ක්‍රියාකලාපය ගැන ද කිසිදු විවේචනයක් නොකරයි.

කැබතිගොල්ලෑව ඝාතන සම්බන්ධයෙන් ගත් කල, එල්ටීටීඊය ඒ ගැන වගකිව යුතු ය යන්න කිසි සේත් නිශ්චිත නැත. ජවිපෙ, හෙල උරුමය හෝ මිලිටරියේ කොටස් සිය දේශපාලන එල්ලයන් ජය ගනු වස් මෙම ජන ඝාතනය සංවිධානය කලා වීමට බෙහෙවින් ඉඩ ඇත. නිශ්චිතව ම, ඝාතනයන්ගෙන් ඉක්බිතිව, සිංහල අන්තවාදීන්ගේ යුද ඝෝෂාව කන් බිහිරි කරවන මට්ටමට උත්සන්න වී ඇති අතර සන්නද්ධ හමුදා එල්ටීටීඊයේ බල ප්‍රදේශ මත ගුවන් හා කාල තුවක්කු ප්‍රහාර මාලාවක් දියත් කරනු පිනිස එම සිද්ධිය ඩැහැ ගෙන තිබේ. පසු ගිය සතිය මුලුල්ලේ ම, ප්‍රහාර හා ප්‍රතිප්‍රහාර දිනපතා ම පාහේ සිදු කරමින්, විවෘත යුද ගැටුම දෙසට ලුහුටා යාම වේගවත් කෙරී ඇත.

## "මූල හේතු"

ආන්ඩුවේ සාම ලේකම් කාර්යාලයේ ප්‍රකාශයේ වඩාත් ම නරුම අංශය නම් මෙසේ ප්‍රකාශ කරන කොටසයි: "එල්ටීටීඊයට ආයුධ හා ත්‍රස්තවාදයේ මාවත ගැනීමට තුඩු දී ඇති ගැටුමේ මූල හේතුවලට ආමන්ත්‍රනය කරනු පිනිස එල්ටීටීඊය සාකච්ඡාවලට යොදවා ගැනීමට එය (ආන්ඩුව) උත්සාහ දරයි. විරුද්ධාභාසය නම්, එල්ටීටීඊය ශ්‍රී ලංකාවේ ආන්ඩුව සමග පැවති කිසිදු සාකච්ඡාවක දී ගැටුමේ මූල හේතුවලට ආමන්ත්‍රනය කිරීමට හා ඒවාට පිලියම් යෙදීමට කිසිදාක එකඟ නොවීම යි."

යුද්ධයේ මූල හේතු පවතින්නේ 1948 දී එහි උත්පත්තියේ පටන් මේ දක්වා ම ශ්‍රී ලංකා රාජ්‍යය තුල මුල් බැස පවත්නා දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙත තුල ය. කොලඹ ආන්ඩු කම්කරු පන්තිය බෙදීමේ හා ස්වකීය සමාජ පදනම ආරක්ෂා කර ගැනීමේ විධික්‍රමයක් ලෙස දෙමල විරෝධී වර්ගවාදය ඇවිලවීමටත් එය ගසා කෑමටත් නැවත නැවතත් ක්‍රියා කර ඇත. බුද්ධාගම රටේ රාජ්‍ය ආගම බවට පත් කරන ව්‍යවස්ථාමය විධි විධාන තුල වඩාත් ම පැහැදිලිව ප්‍රකාශයට පත් වන, දෙමල ජනතාවට හා සෙසු සුලුතරයන්ට එරෙහි ක්‍රමානුකූල වෙනස්කම් කිරීම් අවසන් කිරීමේ කිසිදු අභිප්‍රායක් රාජපක්ෂ ආන්ඩුවට නැත.

ආන්ඩුවේ සාම ලේකම් කාර්යාලය මූල හේතුවලට ආමන්ත්‍රනය කිරීම ගැන කතා කරන අතරතුර, එහි ආරක්ෂක හමුදාවෝ දෙමල ජනයා ක්‍රමානුකූලව හිරිහැරයට, බිය ගැන්වීම්වලට හා මර්දනයන්ට ලක් කිරීමේ නිරතව සිටිති. පසු ගිය මාස හය මුලුල්ලේ, මිලිටරිය මාර්ග බාධක, පුද්ගලයන් හිතුවක්කාරී ලෙස සෝදිසියට ලක් කිරීම් සහ "වටලා සිදු කරන සෝදිසි මෙහෙයුම්" යන නමින් ප්‍රසිද්ධ මහා පරිමාන වටලෑම් යලි ආරම්භ කර තිබේ. ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳ මෑත ම චෝදනා එල්ල වන්නේ පේසාලෙයි ගමේ වැසියන්ගෙනි. තමන් ආරක්ෂාව පතා රැඳී සිටි පල්ලියක් තුලට බෝම්බයක් දමා ගසා කාන්තාවක ඝාතනය කොට තවත් 40කට තුවාල සිදු කල බවට එම ගම් වැසියෝ පසු ගිය සතියේ දී නාවික හමුදා භටයන්ට චෝදනා කලහ. බිෂොප් රායප්පු ජෝශප්, "ශ්‍රී ලංකා නාවික හමුදාව නමැති අයුක්ත සහගත ආක්‍රමනිකයා විසින් අහිංසක ජනතාවගේ ලේ වැගිරීම්" ගැන විරෝධය පල කරමින්, වතිකානුව වෙත ලිපියක් යවා ඇත.

2002 දී සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව මේ වන තෙක් පැවති සිවු වසරක කාලය මුලුල්ලේ, ආනුශංගික කොලඹ ආන්ඩු, ගැටුමේ “මූල හේතුවලට” තබා, බලය බෙදා ගැනීමේ සැකැස්මක් පිලිබඳ ගැටලුවට වත් කිසිදාක ආමන්ත්‍රනය කර නැත. පලමු සාකච්ඡා වටයේ දී, එල්ටීටීඊය වෙනම දෙමල ඊලම් රාජ්‍යයක් පිලිබඳ සිය ඉල්ලීම ආකාරගතව අතහැර දමා දිවයින “ව්‍යාඝ්‍ර ආර්ථිකයක්” -- එනම්, විදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් -- බවට පරිවර්තනය කිරීම සඳහා සහාය වීමට ඇති සිය කැමැත්ත ප්‍රකාශයට පත් කලේ ය. එහෙත්, ආරම්භයේ පටන් ම, එජාප නායකත්වයෙන් යුත් ආන්ඩුවට මුහුන දීමට සිදු වූයේ සටන් විරාමය ජාතිය “පාවාදීමක්” ලෙස සැලකූ, ජවිපයේ ස්වෝත්තමවාදී විරුද්ධත්වයට හා වෛරී මිලිටරියකට ය.

මිලිටරිය, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සමග පෙල ගැසී ගෙන, සාකච්ඡා කඩාකප්පල් කිරීමේ උත්සාහයක් ලෙස, එක දිගට ම ප්‍රකෝපකරනයන් ඇදීමෙහි නිරත විය. මැත දී ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් ලෙස පත් කරන ලද, රියර් අද්මිරාල් දයා සඳගිරි යටතේ පැවති නාවික හමුදාව, ගැඹුරු මුහුදේ දී එල්ටීටීඊ යාත්‍රා ගනනාවක් ම ගිල්වා දමා 2003 අප්‍රේල් මාසයේ දී එල්ටීටීඊය සාකච්ඡාවලින් ඉවත් වීමට පොලඹවාලනු පිනිස මූලික ක්‍රියාකලාපයක් ඉටු කලේ ය.

අර්ථභාරී ලෙස, සාකච්ඡා යලි අරඹනු සඳහා පදනම ලෙස 2003 ඔක්තෝබර් අග දී උතුරු හා නැගෙනහිර පලාත්වල අන්තර් වාර ස්වයං පාලන අධිකාරියක් පිලිබඳ යෝජනා මාලාවක් ඉදිරිපත් කලේ එල්ටීටීඊය යි. ඉන් දින ගනනාවත් ඇතුලත, ජවිපෙ වෙතින් ගලා ආ හෙලා දැකීම් හා මිලිටරියේ ඉහල කොටස්වල උද්ඝෝෂන මාලාවක් මධ්‍යයේ, ජනාධිපති කුමාරතුංග ආරක්ෂක අමාත්‍යාංශය ඇතුලු මූලික අමාත්‍යාංශ තුනක් හිතුවක්කාරී ලෙස පවරා ගත් අතර, ඇය හදිසි නීතිය පැනවීමෙන් හා ආන්ඩුව බලයෙන් පහ කිරීමෙන් පසු බැස්සේ ජාත්‍යන්තර පීඩනය එල්ල වූ නිසා ම පමනි.

කුමාරතුංග අවසානයේ 2004 පෙබරවාරියේ දී ආන්ඩුව බලයෙන් පහ කල අතර, එය අලුත් මැතිවරන සඳහා ද ජවිපෙ ඇතුලත් එජනිස ආන්ඩුවක් බලයට පැමිනීම සඳහා ද පදනම සැකසී ය. විශේෂයෙන් ම 2004 දෙසැම්බර් සුනාමිය මගින් ඇති කෙරුනු ව්‍යසනයෙන් ඉක්බිතිව, ජනාධිපතිනිය, සාම සාකච්ඡා යලි අරඹන ලෙස ඉල්ලමින් එල්ල කෙරුනු සැලකිය යුතු මට්ටමේ ජාත්‍යන්තර පීඩනයකට මුහුන දුන්නා ය. එහෙත් ආධාර බෙදා හැරීම පිනිස එල්ටීටීඊය සමග තාවකාලික ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවීමේ ප්‍රයත්නයන් පවා ජවිපෙ සමග භේදයක් නිර්මානය කල අතර එය හේතු කොට ගෙන ආන්ඩුව පාර්ලිමේන්තුවේ සුලුතරයක් බවට පත් විය. පසු ගිය නොවැම්බරයේ ජනාධිපතිවරනයට පෙරාතුව, රාජපක්ෂ, එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනශීලී ආස්ථානයක් ගන්නා ලෙස ජවිපෙ කල ඉල්ලීම්වලට එකඟවීමේ වියදමින්, එය සමග සන්ධානයක් අටවා ගත්තේ ය.

ශ්‍රී ලංකාවේ ගැටුම් යලි ඇවිලීම සඳහා වගකිව යුතු තවත් මූලික සාධකයක් තිබේ -- එනම්, බුෂ් පාලනාධිකාරයේ ආස්ථානයේ සිදු වී ඇති පැහැදිලි මාරුවකි. එක්සත් ජනපදය 2002 සටන් විරාමයට හා සාම සාකච්ඡාවලට පිටුබලය දුන්නේ, ශ්‍රී ලංකාවේ ජනතාවගේ ඉරනම පිලිබඳ මොන යම් හෝ උත්සුකතාවකින් නොව, වොෂිංටනයට වැඩෙන මූලෝපායික හා ආර්ථික අවශ්‍යතා පවතින -- විශේෂයෙන් ම ඉන්දියා තුල -- දකුනු ආසියාව අස්ථාවර කිරීමේ තර්ජනය මතු කරන ගැටුමක් අවසන් කිරීමේ විධි ක්‍රමයක් ලෙස ය. එල්ටීටීඊය “ත්‍රස්තවාදී සංවිධානයක්” ලෙස හංවඩු ගැසීම මගින් එක්සත් ජනපදය පැහැදිලි කොට ඇත්තේ, සාම උපාය අසාර්ථක වුව හොත් මිලිටරි විකල්පයට පිටුබලය දීමට තමන් නිරතුරුව ම කැමැත්තෙන් සිටින බව යි.

රාජපක්ෂ බලයට පැමිනි දා පටන් මේ වන තෙක්, එක්සත් ජනපද නිලධාරින්ගේ ප්‍රකාශ එල්ටීටීඊයට එරෙහිව තව දුරටත් තර්ජනාත්මක බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ හිටපු එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ් ජනවාරියේ දී අනතුරු ඇඟවූයේ එල්ටීටීඊය කොලඹ ආන්ඩුවේ කොන්දේසි යටතේ සාම සාකච්ඡාවලට එකග නොවී යුද්ධය යලි ඇරඹුන හොත්, “ඔවුන් මුහුන දෙනු ඇත්තේ වඩා ශක්තිමත්, වඩා හැකියාවන්ගෙන් යුක්ත හා වඩා අධිෂ්ඨානවත් ශ්‍රී ලංකා මිලිටරියකට” බව යි. මෙම අදහස් දැක්වීම් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් ශක්තිමත් කිරීමට එක්සත් ජනපද මිලිටරි ආධාර ලබා දෙන බවට කල නිසැක තර්ජනයකි.

එල්ටීටීඊය ජාත්‍යන්තරව හුදකලා කිරීමේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයන් පසුපස සිටියේ වොෂිංටනය යි. මැත දී, එක්සත් ජනපදයේ පීඩනය යටතේ, යුරෝපා සංගමය එල්ටීටීඊය “ත්‍රස්තවාදී සංවිධානයක්” ලෙස තහනම් කොට, ඊනියා සාම ක්‍රියාදාමයේ මිනී පෙට්ටියට තවත් ඇනයක් ගැසුවේ ය. එස්එල්එම්එම් තුල සිටින යුරෝපා සංගමයේ රටවල සටන් විරාම නිරීක්ෂකයන් යුරෝපා සංගමයට අයත් නැති රටවල --- නෝර්වේ හා අයිස්ලන්තය -- නියෝජිතයන්ගෙන් විස්ථාපනය කරන ලෙස අවධාරනය කිරිම මගින් එල්ටීටීඊය එයට ප්‍රතිචාර දැක්වීම පුදුමයක් නොවේ. කැබතිගොල්ලෑව ඝාතනවලට පසුව, එක්සත් ජනපදය ක්ෂනිකව ම එල්ටීටීඊයට චෝදනා කලේ, කිසිදු සාක්ෂ්‍යයක් නැතිකම පවා නොතකා ය.

එක්සත් ජනපද ආස්ථානය මගින් සිදුව ඇත්තේ, යුද්ධය දෙසට වන තල්ලුව උත්සන්න කිරීමෙහි ලා රාජපක්ෂ

ආන්ඩුව හා එහි ස්වෝත්තමවාදී සගයන් තව දුරටත් දිරිගැන්වීම යි. ඊයේ පාර්ලිමේන්තුව හමුවේ ප්‍රකාශයක් කල ජවිපෙ නායක විමල් වීරවංශ එල්ටීටීඊය උමතු ලෙස හෙලා දකිමින් එය තහනම් කරන ලෙසත් උතුරු හා නැගෙනහිර පලාත් වෙන් කරන ලෙසත් “නැගෙනහිර කොටින්ගෙන් මුදා ගැනීම” සඳහා වහාම මිලිටරි ව්‍යායාමයක් දියත් කරන ලෙසත් ඉල්ලා සිටියේ ය. මිලිටරියේ වත්මන් “සීමිත” පලි ගැනීමේ ප්‍රහාර විවේචනයට ලක් කරන ජවිපෙ, “ත්‍රස්තවාදයට සීමාවක් නැති” බව ප්‍රකාශ කරමින් එල්ටීටීඊයට එරෙහිව “පූර්න පරිමාන ප්‍රහාරයක්” දියත් කරන ලෙස ඉල්ලා සිටී.

කොලඹ දේශපාලන සංස්ථාපිතයේ සෙසු කොටස් ඉක්මනින් ම මෙම පිලිවෙත වටා පෙල ගැසෙමින් සිටී. අතීතයේ දී සාම ක්‍රියාදාමය වෙනුවෙන් පෙනී සිට ඇති එජාපය, යුද ප්‍රයත්නය සඳහා සහයෝගය අවුලුවාලනු වස් ගම්මානවලට සිය මන්ත්‍රීවරු යවමින්, යුද කරත්තයට පැන ගෙන ඇත. කලින් සාම සාකච්ඡා සඳහා තල්ලුව දී තිබූ ඩේලි මිරර් පත්‍රය ජූනි 15 දා නිකුත් කල කතුවැකියකින්, “ජාතික එකමුතුව” සඳහා කැඳවුම් කොට, “රට අස්ථාවර කිරීමට හා බෙදීමට කුමන්ත්‍රනය කරන බවට සැක කෙරෙන සියලු ම දෙනාට සහාය දෙන” ආකාරයේ මොන ම විවේචනයක් වත් ආන්ඩුවට එරෙහිව නොකරන ලෙස එජාපයෙන් ඉල්ලා සිටියේ ය.

“සාම ලේකම් කාර්යාලයේ” නිවේදනය යුද්ධය සඳහා වූ මෙම උමතු සහගත සූදානමේ ම කොටසකි.